# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි අවසාන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## වාදන කලා ඉතිහාසය – DPMD 41032

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න අටකින් (08) සමන්විත ය.

❖ එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් (01) හෝ තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.

❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

## I කොටස

01. "ශ්‍රී ලාංකේය වාදන කලාව 30 දශකයෙන් පසු නව මාවතකට ප්‍රවේශ විය." ඔබගේ අදහස් දක්වන්න.

02. සාම්ප්‍රදායික නර්තන හා වාදන ශිල්පක්‍රම ආයතනික අධ්‍යාපන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ටවීමේ දී සිදුවී ඇති වෙනස්කම් පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

03. දේශීය වාදන කලාවේ ප්‍රවනතා පිළිබඳ අවධානය යොමුකරමින්, නව නිර්මාණකරුවන් දෙදෙනෙකුගේ දයකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

04. "නූතන බෙර සංධ්වනි ශ්‍රී ලාංකේය ප්‍රාසංගික වේදිකාවේ ප්‍රමුඛ අංගයකි." මෙය සාම්ප්‍රදායික වාදන කලාවට කෙසේ බලපා ඇද්ද? විමසන්න.

05. දේශීය භේරි වාදන නිර්මාණකරණයේ දී නිර්මාණකරුවකුගේ කාර්යභාරය පිළිබඳ පැහැදිලි කරන්න.

## II කොටස

06. පඤ්චාංගික තූර්ය වර්ගීකරණය පිළිබඳ විවිධ මත සාකච්ඡා කරන්න.

07. "ශ්‍රී ලාංකේය භේරි වාදනය අද්‍යතනයේ සංවර්ධනයට පත් වූ කලාවකි." වාදන නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

08. තබ්ලා, පඛාවජ් සහ මෘදංගම් යන අවනද්ධ භාණ්ඩයන්හි ව්‍යුහය රූප සටහන් ඇසුරින් පැහැදිලි කර ඒවායෙන් උත්පාදනය වන ධ්වනි පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

…………………. 2023.01.30